www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෙහ්මන් බ්‍රදර්ස් බිඳ වැටීමේ සිට වසර දෙකක්

## Two years since the collapse of Lehman Brothers

**2010 සැප්තැම්බර් 15**

1930 ගනන්වල මහා අවපාතයෙන් පසුව බරපතලම මූල්‍ය හා ආර්ථික අර්බුදය අවුලුවාලූ ලෙහෙමන් බ්‍රදර්ස් (බැංකුව) බිඳ වැටීමෙන් වසර දෙකක් ඉක්ම යාමෙන් පසුව ද එයට යටින් පැවති ලෝක ධනේශ්වර පද්ධතියේ කිසිදු පරස්පරවිරෝධයක් විසඳී ඇත්තේ නැත. ඊට විපරීතව අර්බුදයේ බර කම්කරුවන් මත පැටවීම සඳහා ලෝකය පුරා පාලක පන්තීන් ප්‍රහාරයක් දියත් කර තිබියදී එම ප්‍රතිවිරෝධයෝ ඊටත් වඩා විනාශකාරී ස්වරූපයන් ගෙන තිබේ.

ලෙහේමන් බිඳවැටී සති ගනනක් තුල සමස්ත ලෝක මූල්‍ය පද්ධතියම කඩා වැටීමේ අද්දරට පැමිනියේ ය. එක්සත් ජනපද ජනාධිපති රූපවාහිනියේ පෙනී සිටිමින් අනතුරු ඇඟවූයේ "ඇමරිකාවේ මූල්‍ය පද්ධතියේ ප්‍රධාන කොටස් වැසී යාමේ අනතුරට මුහුනපා සිටි" ක්ෂනික පියවරය නොගතහොත් "ඇමරිකාව මූල්‍ය කුලප්පුවකට මුහුන දෙනු ඇත" යනුවෙනි. 1930 ගනන්වල අර්බුදයේ පතුලෙන් මෙහා පැත්තේ එවැනි දෙයක් සිදුවී නැත.

ඊලඟ මාස තුන ඇතුලත, 1929 ඔක්තෝබරයේ වෝල් වීදියේ (ඇමරිකානු කොටස් වෙලඳපල) කඩා වැටීමෙන් ඉක්බිති සතිවල ඇතිවූ කඩා වැටීමට වඩා වේගවත් අනුපාතයකින් ජාත්‍යන්තර වෙලඳම, ආයෝජන, කොටස් වෙලඳපොලේ මිල ගනන් හා කාර්මික නිෂ්පාදන බිඳවැටීම ආරම්භ විය.

සමස්ත මූල්‍ය පද්ධතියම දිය වී යෑම නවතා ලූයේ, බැංකු හා මූල්‍ය ආයතනවලට ඉතිහාසයේ විශාලතම ඇප දීම් ප්‍රදානය කිරීම තුලින් පමනි. සමාජ තත්වයන් වැඩිදියුනු කිරීම සඳහා ඉදිරිපත්වූ සෑම ඉල්ලීමකට ප්‍රතිචාරය වූයේ "මුදල් නැත" යන්නයි. ඉන් වසර ගනනකට පසුව මහා බැංකුවලට හා මූල්‍යායතනවලට සැපයීම සඳහා ලෝකය පුරා ආන්ඩු හා මහ බැංකු හදිසියේම ඩොලර් බිලියන සිය ගනනක් එසේ නැත්නම් දහස් ගනනක් සොයා ගත්තේ ය. ඩොලර් ට්‍රිලියන 14 ක් පමන වන මුදා ගැනීමේ මෙහෙයුමේ එකතුව ලෝක දල දේශීය නිෂ්පාදිතයෙන් හතරෙන් පංගුවකට සමාන වේ.

අර්බුදයට හේතු කාරකවූ එම ආයතන ම ගලවා ගැනීමට ඔවුන් ඉදිරිපත්වීමේ කාරනය මුල්කරගෙන ජනනය කල ගැඹුරු කෝපය නිසාවෙන් රාජ්‍ය නායකයෝ, යම් "වාම" රඟපෑමක යෙදී සිටියහ. එනම්, එවැනි අර්බුදයක් යලි ඇති නොවන බවට ප්‍රතිඥා දීමේ පියවර ගනු ලැබින. ව්‍යසනයට වගකිව යුතු නොසැලකිලිමත් හා සමහර අවස්ථාවල මුලුමනින්ම සාපරාධී වූ බැංකු හා මූල්‍ය ආයතනවල කටයුතු යම් තරමකින් නියාමනයකට ලක් කල යුතු බවට මතයක් පැතිර තිබීම නිසා එසේ කිරීමට සිදුව තිබුනි.

දක්ෂිනාංශික ප්‍රන්ස ජනාධිපති නිකොලායි සාකෝසි ධනේශ්වර අන්තවාදීන් වෙත කඩා පැන්නේ ය. සමාජ ප්‍රජාතන්ත්‍රවාදයට ධනවාදය බේරා ගැනීමට සිදු වී ඇති බව අවධාරනය කරමින් ඕස්ට්‍රේලියානු අගමැති කෙවින් රඩ් "නව ලිබරල්වාදය" හෙලා දකිමින් වචන 7,000 ක වාර්තාවක් ඉදිරිපත් කලේ ය.

වසර දෙකකට පසුව නියම තත්වයට පැමිනෙනවා වෙනුවට බැංකු නැවතත් පැරනි ආකාරයටම ක්‍රියා කරයි. යලි තහවුරු වීමේ හා ඒකාබද්ධ වීමේ ක්‍රියාවලීන්ගෙන් පසුව එක්සත් ජනපද බැංකු ආර්ථිකය මත හා ඒ නිසාම ආන්ඩුව මත ද බිඳවැටීමට කලින් තිබුනාටත් වඩා දැඩි ග්‍රහනයක් පවත්වාගෙන යයි.

ලාභ, පූර්ව අර්බුද මට්ටම් කරා නැවත පැමින තිබෙන අතර ඩොලර් දශ ලක්ෂ ගනනින් බෝනස් ගෙවීම යලි අරඹා තිබේ. 2009 සුලු පසු පසුබෑමකින් අනතුරුව මූල්‍ය සමපේක්ෂනයෙන් සිය ධනයේ වැඩි පංගුව උපුටාගත් ලෝකය පුරා සුපිරි ධනවතුන්ගේ කොටස් මිල නැවත ඉහල යමින් තිබේ.

බැංකු හා මූල්‍ය ආයතන ඔවුන්ම නිපදවූ අර්බුදයට වන්දි ගෙවනවා වෙනුවට එයින් ලාභ උපයමින් සිටී.

ගෝල්ඩ්මන් සැක්ස්හි ප්‍රධාන විධායක ලොයිඩ් බ්ලැන්ක්ෆීන් පසුගිය නොවැම්බර් මාසයේ දී ප්‍රකාශ කලේ ඔහු "දෙවියන්ගේ කටයුතුවල නිරතව සිටින" බවයි. එහෙත්, බැංකුවල තත්වය නැවත ස්ථාපිත කිරීමේ එම කාර්යය දිව්‍යමය එකක් වූයේ නැත. ගෝල්ඩ්මන් සැක්ස් හා එහි සහකරුවන්ගේ ලාභ ඉහල යාමේ වැඩි කොටසකට දායක වූයේ බින්දුවට ආසන්න පොලී අනුපාතයකට ඇමරිකානු මහ බැංකුවෙන් නයට ගත් මුදල් ආපසු වැඩි පොලියකට ඇමරිකානු ආන්ඩුවට නයට දීමෙන්ය.

2008 බිඳවැටීමෙන් පසුව දියත් කල දැවැන්ත

ඇප දීමේ මෙහෙයුමෙන්, අර්බුදය විසඳුනේ නැත. හුදෙක් ඉන් සිදු වූයේ බැංකු මගින් ගොඩනගා ගන්නා ලද වටිනාකමක් නැති "විෂ සහිත වත්කම්" ධනේශ්වර රාජ්‍යය වෙත මාරු කිරීම පමනි. දැන් බිල ගෙවීමට තිබේ.... මූල්‍ය ප්‍රාග්ධනය විසින් නොව කම්කරු පන්තිය විසිනි. ලෝකය පුරා ආන්ඩු ක්‍රියාත්මක කරමින් සිටින කප්පාදු පිලිවෙත්වල හා ඒවා බලගැන්වීමට ආඥාදායක ස්වරූපයේ පාලනයන් වර්ධනය කිරීමේ තේරුම මෙයයි.

බැංකු ලාභ ලබන අතරතුරේ කම්කරු පන්තිය ඔවුන් මෙතෙක් මුහුන දුන් නරකම තත්වයට ඇද වැටී ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ දී මිලියන 30 කට ආසන්න ජනතාව එක්කෝ විරැකියාවේ, ඌන සේවා නියුක්තියේ හෝ ශ්‍රම බලකායෙන් ඉවතට ඇද දමා තිබේ. දීර්ඝ කාලීන විරැකියාව මහා අවපාතයෙන් පසු එහි ඉහලම මට්ටම් කරා ලඟා වී තිබෙන අතර ඔබමා පරිපාලනය සමාජ අර්බුදය විසඳීමේ පියවර ගැනීම ප්‍රතික්ෂේප කරමින් මූල්‍ය ප්‍රාග්ධනයේ අන පරිදි ක්‍රියා කරයි.

බ්‍රිතාන්‍ය සම්බන්ධයෙන් සලකන කල, ගෝලීය මූල්‍ය සමපේක්ෂනයේ සහ පරිපූර්න වංචාවේ ප්‍රධාන මධ්‍යස්ථානයක් වන ලන්ඩන් නගරයේ මිලියන ගනන් මහජනයා පරම්පරා තුනකට පසුව 1980 ගනන්වල කුප්‍රකට තැචර් ආන්ඩුවටත් වඩා දරුනු ලෙස මහජන වියදම් කප්පාදුවේ ප්‍රහාරයකට මුහුන දීමට නියමිත ය.

යුරෝ බිලියන 750 ක ඇපයක් පසුගිය මැයි මාසයේ ප්‍රදානය කිරීමෙන් පසු යුරෝපයේ සියලුම ආන්ඩු, ඊට ගෙවිය යුතු වන්දිය කම්කරු පන්තිය මත පැටවීමේ, මූල්‍ය වෙලඳපලවල් ඉල්ලා සිටින කප්පාදු පියවර ක්‍රියාත්මක කරමින් සිටී.

ඒ අතර මූල්‍ය අර්බුදය දිගින් දිගටම ගැඹුරු වෙමින් තිබේ. යුරෝපයේ රාජ්‍යයන්හි දේශීය නය අර්බුදය විසඳෙනවා වෙනුවට එය, යුරෝපයේ සීමාවන්ගෙන් ඔබ්බෙහි, ලෝකය පුරා ව්‍යාප්ත වී තිබීම පිලිබඳව පසුගිය මාසයේ මෝර්ගන් ස්ටැන්ලි අනතුරු අඟවා සිටියේය. ප්‍රශ්නය වන්නේ, ආන්ඩු සිය නය පැහැර හරී ද යන්න නොව එය සිදු වන්නේ කවදා ද යන්නය. මෙම අනතුරු ඇඟවීමෙන් පසුව අයර්ලන්තයේ, පෘතුගාලයේ හා ග්‍රීසියේ මූල්‍ය ස්ථාවරත්වය සම්බන්ධ නවතම උත්සුකයන් ක්ෂනිකව මතු විය.

*ෆයිනෑන්ෂල් ටයිම්ස්* හි තීරු ලිපි රචක වුල්ෆ්ගැන් මුන්චාවුගේ පසුගිය සඳුදා පලවූ ප්‍රකාශයක, ලෙහ්මන් බිඳවැටී වසර දෙකකින් පසු ද යුරොපීය බැංකු පද්ධතියේ "අඩපන වීම" දිගිටම සිදු වන බව සඳහන් විය. "තවත් වසර පහකට පසුව ද අපට ඒ ගැන කථා කිරීමට සිදුවනු ඇත. එහි අර්ථය, අවම වශයෙන් යුරෝ කලාපය තුලමත් මූල්‍ය අර්බුදය ඔහේ ඇදී යමින් තිබෙන බවයි."

රාජ්‍ය නය, දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 200 ක මට්ටමට ලඟා වෙද්දී ජපානයේ ආර්ථිකය එක තැන පල්වන එක් වසරකින් තවත් වසරකට ඇදී යන්නේ අවසානයක් නොදැකය.

චීනයේ නැඟීම, ස්ථාවරත්වය සම්පාදනය කරන බැවින් ලෝක ධනවාදය වර්ධනයේ නව අවධියකට ඇතුල් වීමට නියමිත යයි පලවන කවර හෝ ප්‍රකාශයක්, චීනයේ වර්ධනයමත් රඳා පවතින්නේ ලෝක ආර්ථිකය මතය යන කාරනය මගින් ගැටලු සහගත කරයි. ප්‍රථම ලෝක සංග්‍රාමය ලෙස 1914 පුපුරා ගිය ලෝක ධනවාදයේ ප්‍රථම මහා බිඳ වැටීමෙන් පසු එක්සත් ජනපදය 1920 ගනන්වල සුවිශාල උත්පාතයක් (බුබුලක්) අත්විඳි අතර දශකයකට පසුව එය බිඳ වැටුනේ ලෝක වෙලඳපල මගින් පැන වූ සීමාවන්හි හැපීමෙන් බව යලි සිහියට නගා ගත යුතු ය.

එලෙසම චීනය එක්සත් ජනපදයට එරෙහිව නැඟී එන විට, එහි වර්ධනය සමඟ භූ දේශපාලනික මෙන්ම ආර්ථික ආතතීන් මාලාවක් නිර්මානය කරමින් තිබේ. දශක හතරකට අඩු කාල පරාසයක් තුල ලෝක යුද්ධ දෙකකට තුඩු දෙමින් කලින් කාලපරිච්ඡේදයේ දී ජර්මනියේ හා ජපානයේ නැඟී ඒම, බ්‍රිතාන්‍ය හා ඇමරිකාවට ඔහේ බලා සිටීමට නො හැකි වූ ලෙසින් ම මෙම ගැටුම් ද කිසිසේත්ම සාමකාමීව විසඳෙනු නැත.

ගෝලීය අර්බුදය පුපුරා ගිය විට, එහි ක්ෂනික ප්‍රති විපාක දෙකක් පිලිබඳව *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අනතුරු ඇඟවීය.

පලමුව, ලාභ පද්ධතියේ අර්බුදය වෙනුවෙන් වන්දිය, කම්කරු පන්තිය වෙතින් අත්කර ගැනීම සඳහා පන්ති සම්බන්ධතාවන්ගේ තියුනු වෙනසක් ඇතිකිරීමටත් පෙර නොවූ විරූ ආඥාදායක පාලන රූපයන් ගොඩනැගීමටත් ලොව පුරා පාලක පන්තීන් මාන බලනවා ඇත. දෙවනුව අධිරාජ්‍යවාදී බලවතුන් අතර එදිරිවාදිකම් හා ගැටුම් උග්‍ර අතට හැරෙන විට ජාත්‍යන්තර සම්බන්ධතාවයන් "ප්‍රතිව්‍යුහගත" කෙරෙනු ඇත.

මෙම අනතුරු ඇඟවීම් සනාථ වී ඇත. පසුගිය වසර දෙක පුරා සමස්ත දේශපාලන උපරිව්‍යුහයම දකුනට මාරු වී ඇත. කම්කරු පන්තිය තමන්ගේම අවශ්‍යතා තුල අර්බුදය විසඳීමේ හා ධනවාදය මානව වර්ගයා ඇද දමන අන්ධ පථයෙන් ඉවතට මාවතක් විවෘත කර ගැනීමේත් තම ස්වාධීන සමාජවාදී ක්‍රියාමාර්ගය වර්ධනය කරමින් මැදිහත් වන තෙක් මෙම ක්‍රියාදාමය අඛන්ඩව හා උත්සන්න වෙමින් ඇදී යනු ඇත.

නික් බීම්ස්

© www.wsws.org